සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

# 13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024
## தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

**ශ්‍රී ලංකා ඉතිහාසය - I (I කොටස)** | 25 | S | I | කාලය / நேரம் / Time } පැය 3.10 යි

නම / பெயர் / Name } ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. } ..........................

උපදෙස්
- මෙම ප්‍රශ්න පත්‍රය I හා II ලෙස කොටස් දෙකකින් සමන්විතය
- I කොටසෙහි ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- I හා II කොටස් දෙකටම මුළු කාලය පැය 03.10 කි.

---

I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

01. (1) ඔනෙසික්‍රිටස් (2) ප්ලිනි (3) කොස්මස්
(4) මෙගස්තිනීස් (5) වෙං හෝ (................)

02. (1) මහවැලි ගඟ (2) කැලණි ගඟ (3) අඹන් ගඟ
(4) කළු ගඟ (5) වලවේ ගඟ (................)

03. (1) නන්දිමිත්‍ර (2) සුරනිමල (3) වේළුසුමන
(4) දීඝජන්තු (5) පුස්සදේව (................)

04. (1) සෙයිලාන් (2) තැප්‍රොබේන් (3) සෙරන්ඩීබ්
(4) පලෙසිමුන්ඩු (5) ජනනාථමංගලම් (................)

05. (1) මාඝ (2) අසේල (3) බුද්ධපාරින්ද
(4) එළාර (5) සේන ගුත්තික (................)

06. (1) පරරාජශේකරම් (2) එදිරිමාන්න සිංහම් (3) සංකිලි
(4) පුවිරාජ පණ්ඩාරම් (5) මයිල්වාගනම් (................)

07. (1) විසුද්ධිමග්ග (2) අමාවතුර (3) ධර්මප්‍රදීපිකා
(4) වෙසතුරුදා සන්නස (5) සසදාවත (................)

08. (1) දන්තුරේ සටන (2) කටුවන සටන (3) බලන සටන
(4) රන්දෙනිවෙල සටන (5) ගන්නෝරුව සටන (................)

09. (1) II රාජසිංහ (2) කීර්ති ශ්‍රී රාජසිංහ (3) විජය රාජසිංහ
(4) රාජාධි රාජසිංහ (5) ශ්‍රී වික්‍රම රාජසිංහ (................)

10. (1) කෝල්බෲක් (2) සෝල්බරි (3) ඩොනමෝර්
(4) කැමරන් (5) මෝර්ගන් (................)

- අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැ' යි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

11. (1) යාල්පාන වෛපව මාලෛ - මයිල්වාගනම් (2) ටොපොග්‍රැෆියා ක්‍රිස්ටියානා - කොස්මස්
(3) ලංකාධිපත්‍යය ෆ්‍රැන්සිස් - වැලන්ටයින් (4) භූගෝල ශාස්ත්‍රය - ටොලමි
(5) ඩිමුන්ඩෝ - ඇරිස්ටෝටල් (................)

12. (1) තිරුකේතීශ්වරම් කෝවිල - කිලිනොච්චිය (2) බැරන්ඩි කෝවිල - සීතාවක
(3) නල්ලූර්හි කන්දසාමි කෝවිල - යාපනය (4) කෝනේශ්වරම් කෝවිල - ත්‍රිකුණාමලය
(5) මුන්නේස්සරම් කෝවිල හලාවත (................)

13. (1) මහින්ද හිමි දේවානම්පියතිස්ස රජතුමා (2) හේමමාලාදන්ත කුමරු - සිරිමේඝවණ්ණ රජතුමා
(3) බුද්ධ ඝෝෂ හිමි බුද්ධදාස රජතුමා (4) ෆාහියන් හිමි - මහානාම රජතුමා
(5) උපාලි හිමි කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (................)

14. (1) පරාක්‍රම සමුද්‍රය පොළොන්නරුව දිස්ත්‍රික්කය (2) සේනානායක සමුද්‍රය - අම්පාර දිස්ත්‍රික්කය
(3) නාච්චිදූව වැව අනුරාධපුර දිස්ත්‍රික්කය (4) යෝධ වැව - මඩකලපුව දිස්ත්‍රික්කය
(5) වික්ටෝරියා ජලාශය මහනුවර දිස්ත්‍රික්කය (................)

15. (1) ජොරිස් ෆන් ස්පිල්බර්ජන් - I විමලධර්මසූරිය රජතුමා (2) හියු බොයිඩ් - II රාජසිංහ රජතුමා
(3) ජෝන් පයිබස් - කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා (4) රොබට් ඇන්ඩෲස් - රාජාධි රාජසිංහ රජතුමා
(5) මැක්ඩොවල් - ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා (................)

- **අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම /ප්‍රකාශන/ දින වකවානු සමූහයක් X හා Y තීරවල දී ඇත. Y තීරයේ දී ඇති නාම /ප්‍රකාශන/ දින වකවානු X තීරයේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. Y තීරය X තීරය සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. නිවැරදි සංයෝගයට අයත් අංකය තෝරා වරහන තුළ ලියන්න.**

16.

| X | | Y |
|---|---|---|
| (1) වේවැල්කැටිය සෙල්ලිපිය | A | ධාන්‍ය තැන්පතු ක්‍රමය |
| (2) තෝනිගල සෙල්ලිපිය | B | I පරාක්‍රමබාහු රජුගේ බුරුම ආක්‍රමණය |
| (3) මිහින්තලා සෙල්ලිපිය | C | වෙළඳපොළක නීති රීති |
| (4) දෙවනගල සෙල්ලිපිය | D | පැරණි අධිකරණ ක්‍රමය |
| (5) බදුලු ටැම් ලිපිය | E | උත්තිය රජුගේ ඓතිහාසිකත්වය |

(1) DECAB (2) DEACB (3) DBCEA (4) DAEBC (5) DCBAE (................)

17.

| X | | Y |
|---|---|---|
| (1) සාරාර්ථ සංග්‍රහය | A | පස්වන කාශ්‍යප |
| (2) ජානකීහරණය | B | II පරාක්‍රමබාහු |
| (3) දම්පියා අටුවා ගැටපදය | C | හතරවන සේන |
| (4) සියබස්ලකර | D | කුමාර ධාතුසේන |
| (5) කව්සිළුමිණ | E | බුද්ධදාස |

(1) BACED (2) DAEBC (3) ECABD (4) EDCAB (5) EDACB (................)

18.

| X | | Y |
|---|---|---|
| (1) එළාර | A | කිත්නුවරගල් |
| (2) වළගම්බා | B | දීඝජන්තු |
| (3) ධාතුසේන | C | චල |
| (4) I විජයබාහු | D | මිගාර |
| (5) I පරාක්‍රමබාහු | E | කපිසීස |

(1) AECDB (2) BEDCA (3) CEBAD (4) DAECB (5) EBDAC (................)

19.

| X | | Y |
|---|---|---|
| (1) කින්නර බද්ද | A | කුඹල් කාර්යාංශය |
| (2) කොට්ටල් බද්ද | B | අලි ඇතුන් පිළිබඳ කාර්යාංශය |
| (3) බඩහැල බද්ද | C | විවීමේ කාර්යාංශය |
| (4) කුරුවේ බද්ද | D | ප්‍රවාහන කාර්යාංශය |
| (5) මඩිගේ බද්ද | E | ශිල්පීන් පිළිබඳ කාර්යාංශය |

(1) CEABD (2) DBACE (3) ABEDC (4) CEBDA (5) CDBAE (................)

20. **X** **Y**

| | X | | Y |
|---|---|---|---|
| (1) | වැලිවිට සරණංකර හිමි | A | ඉංග්‍රීසි අධ්‍යාපනය |
| (2) | කෝල්බෲක්කැමරන් කොමිසම | B | විශ්වවිද්‍යාල අධ්‍යාපනය |
| (3) | එච් එස් ඕල්කට් | C | භික්ෂු අධ්‍යාපනය |
| (4) | ආරුමුග නාවලර් | D | හින්දු අධ්‍යාපනය |
| (5) | රිඩල් කොමිසම | E | බෞද්ධ පාසල් අධ්‍යාපනය |

(1) CABDE (2) CBADE (3) CAEDB (4) CBEDA (5) CEDBA (................)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. ඒ අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ වරහන තුළ ලියන්න.**

21. අභයගිරිය
    (1) අභයගිරි විහාරය වළගම්බා රජු ඉදිකළේය.
    (2) අභයගිරි විහාරය ඉදිකර තිස්ස තෙරුණ්ට පූජා කළේය.
    (3) අභයගිරිය සුප්‍රකට අධ්‍යාපන මධ්‍යස්ථානයකි.
    (4) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ අභයගිරි විහාරයේදීය.
    (5) ෆාහියන් හිමි කාලයක් අභයගිරි විහාරයේ විසූහ. (................)

22. රජරට චෝල පාලනය
    (1) V මිහිඳු රජු චෝල සිරකරුවෙකු බවට පත් විය.
    (2) ක්‍රි.ව.1017 දී ලංකාවේ උතුරු ප්‍රදේශ චෝළ අධිරාජ්‍යය යටතට පත්විය.
    (3) චෝළ පරිපාලනය යටතේ පැවති ප්‍රදේශය මුම්මුඩි ශෝල මණ්ඩලම් යනුවෙන් හැඳින්විණි.
    (4) චෝළ පරිපාලන මධ්‍යස්ථානය ජනනාථමංගලම් ලෙස හැඳින්විණි.
    (5) කාලිංග මාඝ ශ්‍රී ලංකාවේ අවසාන චෝළ පාලකයා වේ. (................)

23. ගම්පොළ සමය
    (1) තිසර සංදේශය මේ යුගයේ රචනා විය.
    (2) තුන්වන වික්‍රමබාහු රජු මෙම යුගයේ සිටි බලවත් පාලකයෙකි.
    (3) ආර්ය චක්‍රවර්තීන් ගම්පොළට අයත් තොටුපලවලින් බදු අයකර ගෙන නැත.
    (4) ගණේෂ්වරාචාරී මෙම යුගයේ සිටි ශිල්පියෙකි.
    (5) ලංකාතිලක සහ ගඩලාදෙණිය යන විහාර ගම්පොළ සමයේදී ඉදිකරන ලදී. (................)

24. 1818 බ්‍රිතාන්‍ය විරෝධි අරගලය
    (1) ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් ආරම්භ විය.
    (2) මඩිගේ මුහන්දිරම් ලෙස හජ්ජි මරික්කාර් පත්කිරීම අරගලයට ආසන්න හේතුවයි.
    (3) කැප්පෙට්ටිපොල දිසාව අරගලයේ ප්‍රධාන නායකයකු විය.
    (4) අරගලයෙන් පසු ජෝන් ඩොයිලි මහනුවර ඒජන්තවරයා විය.
    (5) අරගලයේ නායකයන් බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ද්‍රෝහීන් ලෙස ප්‍රකාශ කළේය. (................)

25. කෝපි වගාව
    (1) ජෝර්ජ් බර්ඩ් විසින් සිංහපිටියේ පළමුවන කෝපි වත්ත ආරම්භ කරන ලදී.
    (2) එඩ්වර්ඩ් බාන්ස් ගන්නෝරුවෙහි කෝපි වත්තක් පිහිටු විය.
    (3) 1835 න් පසු කෝපි අපනයනය ශීඝ්‍රයෙන් ඉහළ ගියේය.
    (4) ලිප්ටන් වෙළඳ ලකුණ යටතේ කෝපි යුරෝපයට යවන ලදී.
    (5) කොළ රෝගයක් හේතුවෙන් කෝපි වගාව පිරිහිණි. (................)

- **අංක 26 සිට 30 තෙක් එක් ඒක ප්‍රශ්නය සඳහා දී ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය. නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තේරා,**
  **(A) සහ (B) පමණක් නිවැරදි නම් ........................................ 1 ද,**
  **(A) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ 2 ද,**
  **(B) සහ (C) පමණක් නිවැරදි නම් ........................................ 3 ද,**
  **(C) සහ (D) පමණක් නිවැරදි නම් ........................................ 4 ද, වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදි නම් ........................................ 5 ද වරහන තුළ ලියන්න.**

| උපදෙස් සම්පිණ්ඩනය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) හා (B) පමණක් නිවැරදිය. | (A) හා (C) පමණක් නිවැරදිය. | (B) හා (C) පමණක් නිවැරදිය. | (C) හා (D) පමණක් නිවැරදිය. | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවැරදිය. |

26. පළමු වැනි විජයබාහු රජු සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
(A) පළමුවැනි විජයබාහු රජු තරුණ වියේදී මාසකුමරු ලෙස හැඳින්වීය.
(B) පළමුවැනි විජයබාහු රජු දියණිය පාණ්ඩ්‍ය කුමාරයෙකු හා විවාහ විය.
(C) පනාකඩුව තඹ සන්නසින් පළමුවැනි විජයබාහු මුහුණදුන් දුෂ්කර සමය පිළිබඳව තොරතුරු අනාවරණය වේ.
(D) පළමුවැනි විජයබාහු රජු බුදල්නාවන්ට විශේෂ වරප්‍රසාද ලබා දී තිබේ. (................)

27. යාපනය රාජධානියේ ඉතිහාසය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය /ප්‍රකාශ නිවැරදි වේද?
(A) පරරාජසේකරම් යාපන රාජධානියෙහි ප්‍රථම පාලකයා විය.
(B) යාපන රාජධානියෙහි පාලකයින් විසින් සීතාවක බැරණ්ඩි කෝවිල ඉදි කරන ලදී.
(C) පට්ටනප්පාලෙයි ග්‍රන්ථය යාපන රාජධානියේ ඉතිහාසය හැදෑරීමට ඇති ප්‍රධානතම මූලාශ්‍රයකි.
(D) ඉබන් බතුතාගේ වාර්තාවට අනුව යාපන රාජධානියෙහි පාලකයා ශ්‍රී ලංකාවේ සුල්තාන්වරයා විය. (................)

28. දහනවවැනි සියවසේ දී ඇති වූ සංස්කෘතික පුනර්ජීවනය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?
(A) ඒ සී ඇස් හමීඩ්ගේ මූලිකත්වයෙන් හින්දු පුනරුදය ආරම්භ විය.
(B) ආරුමුග නාවලර්ගේ මූලිකත්වයෙන් හින්දු පුනරුදය ආරම්භ විය.
(C) අනගාරික ධර්මපාලගෙන් බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයට විශාල දායකත්වයක් ලැබුණි.
(D) සූරියමල් ව්‍යාපාරය බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයෙහිලා මූලිකත්වය ගෙන කටයුතු කළේය. (................)

29. මුහුදුබඩ ප්‍රදේශවල ලන්දේසී පාලනය සම්බන්ධයෙන් පහත කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?
(A) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ, ලන්දේසී පෙරදිග ඉන්දියා වෙළඳ සමාගම විසින් පරිපාලනය කරන ලදී.
(B) ලන්දේසි පෙරදිග අධිරාජ්‍යයේ මූලස්ථානය බතාවියේ පිහිටුවා තිබිණි.
(C) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ කපිතාන් ජෙනරාල්වරයෙකු විසින් පාලනය කරන ලදී.
(D) ශ්‍රී ලංකාවේ ලන්දේසි පාලන ප්‍රදේශ කොමාන්ඩරි පහකට බෙදා පැවතිණ. (................)

30. ඩොනමෝර් අණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් පහත දැක්වෙන කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?
(A) සර්වජන ඡන්දබලය පිරිනැමීම
(B) කැබිනට් ක්‍රමය හඳුන්වාදීම
(C) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
(D) රාජ්‍ය සේවා කොමිසම පිහිටුවීම (................)

- **අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. සිරි සංඝබෝධි චරිතය විස්තර කෙරෙන ග්‍රන්ථය කුමක්ද ?
(1) හත්ථවනගල්ල විහාරවංසය (2) බෝධිවංසය (3) ථූපවංසය
(4) බෝධිවංසට්ඨ කථාව (5) යාපහු විස්තරය (................)

32 යාපහුව රාජධානියේ පළමුවන පාලකයා කවුද?
(1) තුන්වැනි විජයබාහු රජතුමා (2) දෙවෙනි පරාක්‍රමබාහු රජතුමා
(3) පළමුවැනි බුවනෙකබාහු රජතුමා (4) තුන්වැනි පරාක්‍රමබාහු රජතුමා
(5) දෙවැනි බුවනෙකබාහු රජතුමා (................)

33. සපුමල් කුමරු කෝට්ටේ රජවීමෙන් පසුව හඳුන්වනු ලැබුයේ කුමන නමකින්ද ?
(1) හතරවන බුවනෙකබාහු (2) පස්වන බුවනෙකබාහු (3) හයවන බුවනෙකබාහු
(4) දෙවන ජයබාහු (5) තුන්වන පරාක්‍රමබාහු (................)

34. කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවන ලද්දේ ?

(1) ටී බී ජයා (2) බද්උද්දීන් (3) අබ්දුල් කාදර්

(4) එම් සී සිද්දි ලෙබ්බේ (5) ඒ. එච්. ඉස්මයිල් (................)

35. ගන්නෝරුව සටනේදී මරණයට පත් වූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරයා කවුද ?

(1) ජෙරනිමෝ ද අසවේදු (2) දි යෝගෝ ද මෙලෝ ද කුස්තෝ

(3) කොන්ස්තන්තීනු ද සා (4) පිලිප් ද ඔලිවේරා

(5) පේද්‍රෝ ලෝපේස් ද සූසා (................)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි 1,2,3,4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැ'යි තෝරා ඊට අදාළ අංකය වරහන තුළ ලියන්න.**

| | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදි ය. | වැරදි ය. |
| 2 | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3 | වැරදි ය. | වැරදි ය. |
| 4 | වැරදි ය. | නිවැරදි ය. |
| 5 | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|
| 36. දඹදෙණි සමයෙහිදී දැදිගම වෙනම පරිපාලන මධ්‍යස්ථානයක් විය. | දැදිගම පරාක්‍රමබාහු යනුවෙන් හඳුන්වනු ලබන්නේ V පරාක්‍රමබාහු රජුය. | (................) |
| 37. පෘතුගීසීන් විසින් උඩරට රාජ්‍යයට එරෙහිව කරන ලද අවසන් යුද්ධය ගන්නෝරුව සටනයි. | දෙවන රාජසිංහ රජුගේ ප්‍රධාන බලාපොරොත්තුව වූයේ පෘතුගීසීන් මෙරටින් පළවා හැරීමයි. | (................) |
| 38. ලංකාවේ අවසන් ලන්දේසි ආණ්ඩුකාරවරයා වූයේ J. J. ෆන් එංගල් බෙක්ය. | එදාහෙළදිව කෘතිය රොබට් නොක්ස් රචනා කළේය. | (................) |
| 39. පෘතුගීසින් ලංකාවට මුද්‍රණ යන්ත්‍රය හඳුන්වා දෙන ලදී. | මුද්‍රණ යන්ත්‍රය ආධාරයෙන් පෘතුගීසීන් සිය ආගම ප්‍රචාරය කිරීමට කටයුතු කළහ. | (................) |
| 40. ඩොනමෝර් කොමිසම මගින් විධායක කාරක සභා හතක් ආරම්භ විය. | විධායක කාරක සභා සභාපතිවරුන් එක් එක් විෂය ක්ෂේත්‍රය පිළිබඳ වගකීම දැරීය. | (................) |

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

ශ්‍රී ලංකා ඉතිහාසය - II (II කොටස) | 25 | S | II | කාලය / நேரம் / Time

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

උපදෙස්
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරකි.
- **II** කොටස **A, B** සහ **C** ලෙස කොටස් තුනකින් සමන්විත වේ.
- **A** කොටසේ ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C** කොටස්වලින් එක් කොටසකින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් තෝරා ගෙන තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

---

## A කොටස

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

i. එලිෆන්ට්පාස් ii. කල්පිටිය iii. ගොඩවාය
iv. කිරිඳි ඔය v. යෝධ වැව vi. කොළඹ
vii. කතරගම viii. යාපනය නගරය ix. සේරුවිල
x. සේනානායක සමුද්‍රය xi. මහියංගනය xii. මුලතිව් (ලකුණු 12)

## B කොටස

02. බ්‍රිතාන්‍ය අවධිය දක්වා ශ්‍රී ලංකාවේ ඉතිහාසය සකස්වීමට බලපෑ පහත අභ්‍යන්තර භූගෝලීය සාධක විස්තර කරන්න.
(1) ගංගා හා ගංගා නිම්න.
(2) මධ්‍යම කඳුකරය.
(3) වරායයන්. (ලකුණු 16)

03. (1) දේවානම්පියතිස්ස රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01)
(2) මිහිඳු හිමියන් සමග මෙහි පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)
(3) දේවානම්පියතිස්ස රජුගේ කාලයට පෙර පැවති ආගමික ඇදහිලි හා විශ්වාස විස්තර කරන්න. (ලකුණු 05)
(4) දේවානම්පිය තිස්ස රාජ්‍ය සමයේ දේශපාලනය සහ සංස්කෘතික අංශවල ඇති වූ වර්ධනය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

04. අනුරාධපුර යුගය අවසානය දක්වා වාරිකර්මාන්තයේ වර්ධනය විස්තර කරන්න. (ලකුණු 16)

05. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(1) සීගිරිය
(2) I විජයබාහු රජු රජරට මුදවා ගැනීම
(3) දඹදෙණි සමයේ සංස්කෘතිය
(4) කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍යය (ලකුණු 16)

## C කොටස

06. විමලධර්මසූරිය රජු අභියෝග ජය ගනිමින් මෙරට දේශපාලන හා ආර්ථික වර්ධනයට ක්‍රියාකල අයුරු විස්තර කරන්න. (ල.16)

07. ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසින් සහ ලන්දේසීන් අනුගමනය කල ආර්ථික ප්‍රතිපත්ති සංසන්දනාත්මකව විමසන්න. (ල. 16)

08. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ සාකච්ඡා කරන්න. (ල. 16)

09. පහත මාතෘකා අතුරෙන් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(1) ශ්‍රී වික්‍රම රාජසිංහ

(2) 1848 බ්‍රිතාන්‍ය විරෝධි අරගලය

(3) රාජ්‍ය මන්ත්‍රන සභාව

(4) ඩී. එස්. සේනානායක (ල. 16)



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

13 ශ්‍රේණිය අවසාන වාර පරීක්ෂණය - 2024
தரம் 13 ஆண்டிறுதிப் பரீட்சை - 2024 / Grade 13 Final Term Test - 2024

| | | | | |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ඉතිහාසය - II (II කොටස) | 25 | S | II | කාලය / நேரம் / Time |

නම / பெயர் / Name ..........................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................




(9) WWW.PastPapers.WiKi (9)





Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!